# උඩගිය කඩේ







තෙරුණි තේජනා කාංගර

**තෙරුණී තේජනා කාංගර**

**උඩගිය කඩේ**

ප්‍රථම මුද්‍රණය - 2025

ISBN  - 978-624-208-242-4

## පිදුම

**හිසමත නොදුටුවත් මිණි ඔටුණු**

**රජෙක් වගේ මට පෙනුණු අප්පච්චිට**

**පුදදෙන මගේ කතාන්දර නිර්මාණය**

**“උඩගිය කඩේ”**

**පුදමි ආදරෙන්**

**ආදරණීය අප්පච්චිට......**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මාහාමයා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදු වීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් වමා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| කතාව ආරම්භය | 01 – 10 |

# උඩගිය කඩේ

ඔන්න ඉස්සර කාලේ එක ගමක පොඩි කඩයක් තිබුණා. ඒ කඩේ කළේ සයිමන් කියලා කෙනෙක්. ගමේ හැමෝම එයාට කිවුවේ සයිමන් මාමා කියලා.

එක දවසක් සයිමන් මාමා උදේ පාන්දරම කඩයට ගියා. සයිමන් මාමා කඩේ තිබුණු පත්තරයක් අරගෙන කියවන්න පටන් ගත්තා. ලතා කියලා ගෑනු කෙනෙක් කඩය පැත්තට ආවා. සයිමන් මාමා කියව කියවා හිටිය පත්තරය බිම තියලා එන්නෙ කවුද කියලා බැලුවා.

එන්නේ ලතා කියලා දැක්කා. සයිමන් මාමා තමන්ගේ කණ්ණාඩි කුට්ටම දාගත්තා. "ආ ලතා කාලෙකින් කඩේ පැත්තේ" සයිමන් මාමා සද්දෙන් කිව්වා. ලතා කඩේට ඇවිදින් සයිමන් මාමාට ලොකු හිනාවක් පෑවා. ඒ කට ඇරිය පාරට කටේ දත් 32 කම සයිමන් මාමා දැක්කා. මට බැලුම් 25ක් දෙන්න, ලතා කිව්වා.


දුර ඇත

මාමා මල්ලකින් බැලුම් අරගෙන ගණන් කරලා ලතාට දුන්නා. “බැලුම් පුම්බලා දෙන්න පුලුවන්ද” ලතා සයිමන් මාමාගෙන් ඇහුවා. ඒක මොකක්ද? සයිමන් මාමා කිව්වා. කඩේ වෙන වැඩකුත් තිබුනේ නැති එකේ මාමා බැලුන් 25ම පිම්බුවා. “ඔන්න ගන්න” සයිමන් මාමා කිව්වා.

“ආ ඔය ටිකට රුපියල් 250ක්” සයිමන් මාමා ලතා දිහා බලන ගමන් කිව්වා. “බොහෝම ස්තූතියි.” ලතා කිවුවා. ලතා මාමාගෙන් උදව් ඇතුව බැලුන් ලොකු කෝටුවකට තියලා බැදලා බැලුම් ගහක් හදා ගත්තා.


පුම්බපු බැලුම්
විකිණීමට ඇත

එහෙනම් මම යන්නම් කියලා ලතා කඩෙන් යන්න ගියා. සයිමන් මාමා බිම තිබුණ පත්තරය අතට අරගෙන හිටගෙනම කියවන්න පටන් ගත්තා. එදා දවසටම කඬේට කවුරුවත්ම ආවේ නෑ සයිමන් මාමා පස්වරු 8.00 වෙනකම් ඉදලා කඬේ වහලා ගෙදර ගියා. ඊළඟ දවසේ සයිමන් මාමා උදේ පාන්දර කඬේට ගියා.

කඬේට ඇවිල්ලා කඬේ ඇරලා ටික වේලාවක් පාර දිහා බලාගෙන හිටියා.එතකොට තමා සිරිපාල මාමා කඩයට ආවේ. මල්ලී මට පුම්බපු බැලුම් 20 ක් දෙන්න, සිරිපාල කිවුවා. “හා..... හා...... මං දෙන්නම්” සයිමන් මාමා කිව්වා. කලින්දා වගේම බැලුම් 20 පුම්බලා කෝටුවක අමුණලා බැලුම් ගහක් හදලා දුන්නා. “රුපියල් 200 යි.” සයිමන් මාමා කිව්වා. සිරිපාල පුම්බපු බැලුම් ගහ ගමටම පේන්න ආඩම්බරයෙන් අරගෙන ගියා. දවස් කිහිපයක් ඕක උනා.



ගමේ හැමෝම එන්නෙ පුම්බපු බැලුම් ගන්න. සයිමන් මාමා කඩේ තිබුණු සේරම බඩු අයින් කරලා පුම්බපු බැලුම් දැම්මා.දැන් කට්ටිය කඩේට කියන්නේ බැලුම් කඩේ කියලා. සයිමන් මාමාගේ කඩේට එන පාරිභෝගිකයන් වැඩිවුණා. සයිමන් මාමාට දැන් හොඳටම සතුටුයි.

පුම්බපු බැලුම් එක්ක කඩේ දිව්‍ය ලෝකයක් වගේ උනා. එක දවසක් සයිමන් මාමා උදේ පාන්දර කඩයට යනකොට කඩේ තිබුණු තැන නැහැ. ඈත ආකාසේ පාවෙනවා. සයිමන් මාමා කෑ ගැහුවා. ඒ කෑ ගහපු පාරට ගමේ හැමෝම එතනට ආවා. ගමේ හැමෝම දැන් හූ කියනවා. “අයියෝ සයිමන්ගේ කඩේ උඩ” ගමේ එක්කෙනෙක් කිවුවා. කඩේ තව තව උඩ ගියා. මේ වෙනකොට ඉරත් මුදුන්වෙලා.

පිම්බුණු බැලුම් ඉර රස්නෙට එකින් එක පිපිරුවා. එක පාරටම කඩේ බිම වැටුණා. පොළව හෙල්ලුනා. කඩේට මොනවත් වෙලා නෑ. සයිමන් මාමාගේ ඇස් වලින් සතුටු කඳුළු වැටුණා. සයිමන් මාමා දුවලා ගිහින් කඩේ තිබුණු කණුවක් බදාගත්තා. එතන හිටපු ගමේ හැමෝම යන්න ගියා.


130

දවසකින් සයිමන් මාමා කඩේට අළුතින් බඩු ගෙනාවා. බැලුමුත් ගෙනාවා. ටික දවසකින් කලින් සැරේ කඩයට ආව ලතා ආවා.

සයිමන් මාමා තමන්ගේ කණ්ණාඩි අස්සෙන් ලතා දිහා බැලුවා. කඩේ උඩ ගියා නේද?

"මමත් බලන්න ආවා" ලතා කිව්වා. සයිමන් මාමා ඔළුව කහන ගමන් "ඔව්" කිවුවා. මම ආවේ අදත් පුම්බපු බැලුම් ගන්න ලතා කිවුවා. ඕනෑ තරම් බැලුම් දෙන්නම් ගෙනියන්න. මම නම් ආයෙ බැලුම් පුම්බන්නෙ නෑ. සමාවෙන්න ගෙදර ගිහින් පුම්බන්න. බැලුම් කීයක් ඕනෑද? සයිමන් මාමා ඇහුවා, බැලුම් 10ක් දෙන්න ලතා කිව්වා.

සයිමන් මාමා ලතා දිහා බලලා හිනාවෙලා ලතාට බැලුම් ටික දුන්නා. රුපියල් 100යි. සයිමන් මාමා කිවුවා. ලතා බැලුම් ටිකත් අරන් ගෙදර ගියා. සයිමන් මාමා සුපුරුදු පරිදි පත්තරේ අරන් කියවන්න පටන් ගත්තා. එදා ඉදන් ඒ සිද්ධිය අහපු කිසිම කෙනෙක් කඩවල්වල බැලුම් පුම්බලා විකුණුවේ නෑ.



සමාප්තයි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණයවිභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැඟිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසර පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම් අප ලැබූ භාග්‍යයකි. ඒම බස් දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර මෑත ඉතිහාසයේ ඒකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යයාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට ඒක්වීමත් සමග දරුවන් ඒයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර සාධකන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම හිසහ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් ඒයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියටමගේ ප්‍රභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

පුම්බපු බැලුම් එක්ක කඩේ දිව්‍ය ලෝකයක් වගේ උනා. එක දවසක් සයිමන් මාමා උදේ පාන්දර කඩයට යනකොට කඩේ තිබුණු තැන නැහැ. ඈත ආකාසේ පාවෙනවා. සයිමන් මාමා කෑ ගැහුවා. ඒ කෑ ගහපු පාරට ගමේ හැමෝම එතනට ආවා. ගමේ හැමෝම දැන් හූ කියනවා. "අයියෝ සයිමන්ගේ කඩේ උඩ" ගමේ එක්කෙනෙක් කිවුවා. කඩේ තව තව උඩ ගියා. මේ වෙනකොට ඉරත් මුදුන්වෙලා.



**උඩගිය කඩේ**

**තෙරුණි තේජනා කාංගර**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**